**මඩකලපුව මහානගර සභාව - 2020**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

මඩකලපුව මහානගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහානගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහනගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**--------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහානගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහානගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහානගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහනගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි හැර රු.267,903,824ක් පිරිවැය වූ අනෙකුත් වත්කම් ආයතනය දෛනිකව භාවිතා කරනු ලබන නමුත් ඒ සඳහා ක්ෂය සහ සමුච්චිත ක්ෂය වෙන්කිරිම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එහි වටිනාකම තක්සේරු කර ක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (ii) | යන්ත්‍ර, වාහන, ලීබඩු හා උපකරණ සහ පුස්තකාල පොත් ආදියේ සමුච්චිත පිරිවැය රු. 267,903,824ක් ලෙස දක්වා තිබුණත්, ඉන් වෙන්දේසි මගින් ඉවත් කළ වත්කම්වල පිරිවැය ඉවත් කර නොතිබුණි. | වර්තමානයේ සියළුම අයිතමයන්ගේ වටිනාකම දැක්වීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (iii) | 2004 වර්ෂයේ සුනාමියෙන් අස්ථානගත වූ රු.1,475,000ක් වටිනා පොත්වල පිරිවැය පොත්වලින් කපා හැරීමේ අනුමැතිය රහිතව සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් කටයුතු සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් ඉවත් කිරීමට විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |
| (iv) | සභා බලප්‍රදේශයේ 2018, 2019 සහ සමාලෝචිත වර්ෂවල දැවැදි සහ පරිත්‍යාග මගින් පවරන ලද නිශ්චල දේපළ සඳහා මුද්දර ගාස්තු රු.61,692,603කින්, නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයට ගෙවිය යුතු 1%ක ගාස්තු රු.616,926ක් සහ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාට ගෙවිය යුතු රු. 170,900 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම වතාවේ ඔබගේ උපදෙස් පරිදි සියළුම දෑ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (v) | පොදු ගබඩා ගිණුමේ වියදම් ලෙස රු.13,000,000ක් ගිණුම්ගත කර තිබූ නමුත් සමුච්චිත අරමුදල් ගිණුමේ එම වටිනාකම රු.14,428,072ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් කටයුතු සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (vi) | සභාවේ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂය ආරම්භයේදි රු.89,370,199ක් ලෙස දක්වා තිබූ නමුත්, වර්ෂ අවසානයේ එය ශුන්‍ය ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ ණයහිමි වටිනාකම රු.25,986,899ක් විය. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (vii) | මඩකලපුව මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහනගර සභාවට ගිවිසුම් වැඩ සඳහා ගෙවීමට රු.12,534,735ක් ලබාදී තිබූ නමුත් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (viii) | මූලධන වියදම් සඳහා රජයෙන් ලබාදුන් දායකත්ව වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කර නොතිබුණි. | ඉදිරියේදි මේවාද ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (ix) | 2019 වර්ෂය සහ සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ අනෙකුත් පළාත් පාලන ආයතනවලින් අයවිය යුතු රු.33,410,387ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (x) | 2003 වර්ෂයේ අතුරුදහන් වූ රු.6,860,650ක් වූ වතුර බවුසරය සහ රෝද හතරේ ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්වලින් ඉවත්නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා තිබුණි. | මෙම වර්ෂයේ ඔබගේ උපදෙස් ලබා මෙය කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (xi) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායකත්ව මුදල් රු.31,514,139ක් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස අනාවරණය කර නොතිබුණි. | ඊළඟ වර්ෂයේ මෙය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරනු ලබන අතර කොටස් වශයෙන් නිරවුල් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (xii) | 2020 වර්ෂයේ මඩකලපුව මහානගර සභා කොමසාරිස්වරයාට සහ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම්වරයාත් අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේ මඩකලපුව මහනගර සභාව විසින් ඉටුකළ කාර්යයන් සඳහා ලැබිය යුතු හිඟහිටි ලැබීම් රු.5,615,613ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (xiii) | සමාලෝචිත වර්ෂයේ සංචාරක නිකේතනවල ආදායම් මත ලැබිය යුතු ගාස්තු රු.4,409,641ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 117,648,379 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 77,381,609 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝට්ටෙයි මුනෙයි වෙළෙඳපොළ ප්‍රදේශයේ රු.1,778,000ක වියදමින් ඉදිකරන ලද ජීව වායු පද්ධතිය 2018 සැප්තැම්බර් මාසයේදි ඉදීකර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | ආදායම් ඉපයීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ව්‍යාපෘතිය මගින් ආදායම් ඉපැයීමට පියවර ගත යුතුවේ. |
| (ආ) | 2016, 2017 සහ 2019 කාලපරිච්ඡේද සඳහා සංචාරක කර්මාන්තයේ නියැලෙන හෝටල්, භෝජනහල් හා සංචාරක නිකේතනවලින් අයකළ යුතු මුළු පිරිවැටුමෙන් සියයට 1කට නොවැඩි හිඟ බදු රු.2,986,815ක් සභාව විසින් අයකර නොතිබුණි. | හිඟමුදල් අයකර ගැනීම සඳහා ලිපි යවා තිබුණත්, ඔවුන් විසින් ගෙවා නොතිබුණි. | හිඟමුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතු වේ. |